# විදේශයකදී සිදුවන මරණයකදී මෘත දේහය මෙරටට ගෙන්වා ගැනීමේ ක්‍රමවේදය

## විදේශ කටයුතු අමාත්‍යාංශය

විදේශයකදී මරණයක් සිදු වූ විට මෘත දේහය මෙරටට ගෙන්වා ගැනීම සඳහා ළඟම ඥාතින් විසින් විදේශ කටයුතු/කොන්සියුලර් කටයුතු අංශය හා සම්බන්ධව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය,

- සෘජුවම කොන්සියුලර් කටයුතු අංශය වෙත (ලිපිනය : කොන්සියුලර් අංශය, 16 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල.)
- විදේශ කටයුතු/ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල වෙත (නුවර/මාතර/කුරුණෑගල/ත්‍රිකුණාමලය සහ යාපනය
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත
- සතිඅන්තයේ හෝ රජයේ නිවාඩු දිනයන්හි විදේශ කටයුතු /ප්‍රධාන කාර්යාලය, ජනරජ ගෙඩනැගිල්ල, ශ්‍රී බාරෝන් ජයතිලක මාවත,කොළඹ 01

ළඟම ඥාතින් විසින් යොමු කළ යුතු ලියකියවිලි :

- පැමිණිලි පත්‍රය
- මියගිය අයගේ විස්තර (විදෙස් ගමන් බලපත්‍ර පිටපතක්, ජාතික හැඳුනුම්පත සහ උප්පැන්න සහතිකය)
- නිත්‍යානුකූල උරුමකරුගේ දිවුරුම් ප්‍රකාශය (මෘත දේහය මෙරටට ගෙනඒම/භූමදානය/ආදාහනය කිරීම සඳහා කැමැත්ත පළ කිරීම)
- මියගිය අය විවාහක නම් - විවාහ සහතිකය, ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකය.
- අවිවාහක නම් - දෙමාපියන්ගේ ලේඛන ඇතුළත් කළ යුතු වේ.
- විදේශ සේවා යෝජකයාගේ/ නියෝජිතයාගේ තොරතුරු.
- ශ්‍රී ලංකාවේදී මෘත දේහය ලබා ගන්නා පුද්ගලයාගේ තොරතුරු .
- නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහා අමතර ලේඛන (දිවුරුම් ප්‍රකාශ)

විදේශයන්හිදී සිදුවන මරණ මෙරටදී ලියාපදිංචි කිරීම:

- මියගිය අයගේ ඥාතීන් ශ්‍රී ලංකාවේ මරණ සහතිකය ලබා ගැනීම සඳහා කොන්සියුලර් අංශය හරහා අයදුම් කළ යුතු වේ.

## විදේශ රැකියා

### ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

(සහන පියස මධ්‍යස්ථානය/කටුනායක, පළාත් කාර්යාල සහ දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන)

දූත මණ්ඩල වෙතින් ලද දැනුම් දීම අනුව මියගිය විගමණික සේවක/සේවිකාවගේ පවුලේ ඥාතින් වෙත දැනුම් දීම.

මෘත දේහය මෙරටට ගෙන්වා ගැනීම හෝ සත්කාරක රට තුළ ආදාහනය/ භූමදානය කිරීමේ ක්‍රියාවලිය සඳහා කොන්සියුලර් අංශය වෙත යොමු විම පිළිබඳ දැනුවත් කිරීම.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි විගමණික ශ්‍රමිකයකුගේ එම රටේදීම සිදුවන මරණයකදී මෘත දේහය මෙරටට ගෙන්වා ගැනීම හෝ සත්කාරක රට තුළ ආදාහනය/භූමදානය කිරීම සඳහා වැය දැරීමට සේවායෝජකයා / විදේශ නියෝජිතායතනය / විදේශ සමාගම හෝ ඥාතීන් හට හැකියාවක් නොමැති අවස්ථාවලදී ඥාතින්ගේ හෝ දූත මණ්ඩල වල ඉල්ලීම මත මානුෂීය පදනමින් ඊට අවශ්‍ය මූල්‍ය සහන සැපයීම.

මෘත දේහය මෙරටට ගෙන්වා ගැනීම හෝ සත්කාරක රට තුළ ආදාහනය/භූමදානය කිරීමෙන් පසු ලියකියවිලි සම්පූර්ණ නම්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අවමංගල්‍ය කටයුතු සිදුකිරීම/ආගමික වතාවත් සිදුකිරීම සම්බන්ධයෙන් රු.40,000.00 ක මූල්‍ය සහන සැපයීම.

ළඟම ඥාතින් විසින් යොමු කළ යුතු ලියකියවිලි :

- මරණය සම්බන්ධ තොරතුරු ලබා ගැනිමේ පත්‍රය
- මියගිය විගමණික සේවක/ සේවිකාවගේ ළඟම ඥාතියා වෙතින් එම මුදල් ලබා ගැනිම සඳහා වූ ඉල්ලීම් ලිපිය හා ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
- මියගිය විගමණික සේවක/ සේවිකාවගේ ගුවන් ගමන්බලපත්‍රයේ පිටපතක්
- මියගිය විගමණික සේවක/ සේවිකාවගේ ළඟම ඥාතියාහට අයත් බැංකු ගිණුමෙහි විස්තර (පාස්පොතෙහි පිටපතක්) සහ උප්පැන්න සහතික /විවාහක නම් විවාහ සහතිකය
- කොන්සියුලර් අංශය වෙතින් සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශය (මුල් පිටපත) / වෙනත් දිවුරුම් ප්‍රකාශ (ඇත්නම්)
- ග්‍රාම නිළධාරී සහතිකය (අවිවාහක නම් ඒ බව සහතික කළ)
- මරණ සහතිකය(විදේශිය)/ කොන්සියුලර් අංශය මඟින් නිකුත් කරනු ලබන අභාවය තහවුරු කිරිමේ ලිපිය
- මෘත දේහය නිදහස් කර ගැනීමේ ලියකියවිලි, මෘත දේහය මෙරටට ගෙන්වා ඇත්නම්(Cargo Goods Declaration/Air waybill)

මියගිය විගමණික සේවක/ සේවිකාව මියයන විට කාර්යාංශ සක්‍රීය ලියාපදිංචිය පවතිනම් රක්ෂණ වන්දි ලබා ගැනීම සඳහා කාර්යාංශයේ සුභසාධන අංශය වෙත ළඟම ඥාතින් යොමු කිරීම.

විමසීම් සිදු කළ හැකි දුරකථන අංක :

විදේශ සම්බන්ධතා අංශය : 0112871700

සුභසාධන අංශය : 0112365217/ 0112365471